**හිමිකම් රක්ෂණ අරමුදල - 2015**

**--------------------------------------**

හිමිකම් රක්ෂණ අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 67 වන වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2009 අගෝස්තු 24 දිනැති අංක 1616/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත්කරන ලද නියෝගවල 41 (1) නියෝගය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 2.1 මතය

**-----**

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හිමිකම් රක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ

ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2009 අගෝස්තු 24 දිනැති 1616/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය. | |
| (අ) 11 වගන්තිය | වාර්ෂික විගණන වාර්තාව සමඟ වාර්ෂික පරිපාලන වාර්තාව ප්‍රකාශයට පත්කළ යුතු නමුත් 2010 වර්ෂයේ සිට මේ දක්වාම වාර්ෂිකව පරිපාලන වාර්තාවක් පිළියෙල කර ප්‍රකාශයට පත්කර නොතිබුණි. |
| (ආ) 15 (1) වගන්තිය | අවම වශයෙන් අර්ධ වාර්ෂිකව කළමනාකරණ මණ්ඩලය රැස්විය යුතු අතර ජනවාරි මාසයේදී මහා සභා රැස්වීම පැවැත්විය යුතුය. එසේ වුවද, අරමුදල ආරම්භ කළ 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වර්ෂයකට එක් වරක් පමණක් කළමනාකරණ මණ්ඩලය රැස්වී තිබූ අතර, කිසිදු වර්ෂයක මහා සභා රැස්වීමක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,269,267 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,284,088 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,985,179 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම රු.1,799,086 කින් හා ආයෝජන පොලී ආදායම රු.180,333 කින් ඉහළයාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී අරමුදල ආරම්භ කළ 2010 වර්ෂයේදී රු.800,515 ක් වූ මුළු ආදායම සමාලෝචිත වර්ෂය වන විට රු.7,583,400 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2009 අගෝස්තු 24 දිනැති අංක 1616/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ iii වන කොටසේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව අරමුදලේ අරමුණ, ඉඩමක හිමිකම් සම්බන්ධතාවයක් පිළිබඳ වංචනික හෝ වැරදි සහගත හිමිකම් ලියාපදිංචිය සම්බන්ධයෙන් සිදුවන

හානි පූර්ණය සඳහා වන්දි ගෙවීම වුවද, ඒ පිළිබඳව පොදු ජනතාව දැනුවත් නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු හානිපූර්ණ වන්දියක් ගෙවා නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

2009 අගෝස්තු 24 දිනැති අංක 1616/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 42 වගන්තිය ප්‍රකාරව හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් රැස්කරනු ලබන ආදායම් පිළිබඳව සති දෙකකට වරක් ගෙන්වා ගතයුතු වාර්තා නියමිත පරිදි ගෙන්වාගෙන හිමිකම් ආදායම් පිළිබඳ රෙජිස්ටරය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. එම නිසා හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් රැස් කළ ආදායම හා අරමුදලට බැර වූ ආදායම අතර සැසඳීමක් කළ නොහැකි විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

අරමුදලේ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද ඒ සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබූ අතර සංශෝධිත අයවැය ලේඛණයට අනුකූලව එය සංශෝධනය කර නොතිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත හා තත්‍ය ආදායම් අතර සියයට 20 ක විචලනයක් ද අයවැයගත හා තත්‍ය වියදම් අතර සියයට 25 ක විචලනයක් ද පැවතුණි. එමනිසා අරමුදලේ අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලද අතර කාර්යසාධන වාර්තා සකස් කර ප්‍රගතිය සමාලෝචනය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.